25.07.2016

# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම - 2016
## නර්තනය (දේශීය) I , II

කාලය පැය 03 යි.

විභාග අංකයෙ: .......................................

| 11 ශ්‍රේණිය | I කොටස |
| --- | --- |

උපදෙස්

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

01. බලි ශාන්ති කර්මය පවත්වනුයේ,
    (1) සමන් දෙවියන් වෙනුවෙනි. (2) පත්තිනි දෙවියන් වෙනුවෙනි.
    (3) කතරගම දෙවියන් වෙනුවෙනි. (4) නව ග්‍රහයින් වෙනුවෙනි.

02. "ඒ වේදෙහ රජුගේ විධානයෙන් ආතත, විතත .................." යනා දී වශයෙන් සඳහන් වනුයේ,
    (1) කුරුණෑගල යුගයට අයත් ථූපවංශයේ ය.
    (2) කුරුණෑගල යුගයට අයත් උම්මග්ග ජාතකයේ ය.
    (3) දඹදෙණි යුගයට අයත් උම්මග්ග ජාතකයේ ය.
    (4) යාපහුව යුගයට අයත් මහා වංශයේ ය.

03. විලම්භ, මධ්‍ය, දෘත නර්තනයේ දී හඳුන්වනු ලබන්නේ .................... යනුවෙනි.
    (1) ත්‍රිතාල (2) මාත්‍රා ප්‍රභේද
    (3) ත්‍රිවිධ ලය (4) තිත්

04. කරදිය මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,
    (1) චිත්‍රසේන ශූරීන් විසිනි. (2) පණිභාරත ශූරීන් විසිනි.
    (3) ප්‍රේමකුමාර ශූරීන් විසිනි. (4) කේ.එස්. ප්‍රනාන්දු ශූරීන් විසිනි.

05. භරතමුණි පඬිවරයා විසින් රචනා කරන ලද්දේ,
    (1) සැළලිහිණි සංදේශයයි. (2) නාට්‍ය ශාස්ත්‍රයයි.
    (3) උම්මග්ග ජාතකයයි (4) ගුත්තිල කාව්‍යයයි.

06. ශ්‍රී ලංකාවේ නර්තන කලා ඉතිහාසය පිළිබඳ ගල් කැටයම් දක්නට ලැබෙන්නේ,
    (1) යාපහුව මාළිගය සහ ඇම්බැක්කේ දේවාලයේ ය.
    (2) යාපහුව මාළිගය සහ ගඩලාදෙණිය විහාරයේ ය.
    (3) කොටවෙහෙර සහ ගඩලාදෙණිය විහාරයේ ය.
    (4) කොටවෙහෙර සහ ඇම්බැක්කේ දේවාලයේ ය.

07. ආවැන්දුම, දොළහ පෙළපාලිය සහ මල්පද නැටීම පිළිවෙළින්......................... ශාන්ති කර්ම වල දැකිය හැකිය.
    (1) පහතරට, උඩරට, සබරගමු (2) සබරගමු, උඩරට, පහතරට
    (3) උඩරට, සබරගමු, පහතරට (4) උඩරට, පහතරට, සබරගමු

08. ගායනයත් සමඟ තිත වාදනය කිරීම සහ ගායනයට පෙර තිත වාදනය කිරීම හඳුන්වනුයේ,
    (1) සමග්‍රහ සහ විෂමග්‍රහ නමිනි. (2) විෂමග්‍රහ සහ අවග්‍රහ නමිනි.
    (3) අවග්‍රහ සහ සමග්‍රහ නමිනි. (4) සමග්‍රහ සහ අවග්‍රහ නමිනි.

09. මාත්‍රා 2 + 2 + 4 තාල රූපයෙන් හඳුන්වන්නේ,

(1) දෙසුළු මැදුම් තුන්තිත ය. (2) සුළු මහ දෙතිත ය.

(3) දෙසුළු මහ තුන්තිත ය. (4) දෙමැදුම් මහ තුන්තිත ය.

10. "විදෙන ලෙලෙන තරු බර පුළුලුකුල රැඳී ..............." මෙය,

(1) කෝට්ටේ යුගයට අයත් සැළලිහිණි සංදේශයේ සඳහන් කවියකි.

(2) දඹදෙණි යුගයට අයත් කෝකිල සංදේශයේ සඳහන් කවියකි.

(3) මහනුවර යුගයට අයත් හංස සංදේශයේ සඳහන් කවියකි.

(4) අනුරාධපුර යුගයට අයත් සැවුල් සංදේශයේ සඳහන් කවියකි.

11 සිට 13 දක්වා ප්‍රශ්නවලට රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.




11. අනුපිළිවෙළ අනුව මෙම භාණ්ඩ මෙසේ නම් කෙරේ.

(1) ගැටබෙරය, තම්මැට්ටම, උඩරට දවුල, නලාව සහ පන්තේරුව

(2) ගැටබෙරය, තම්මැට්ටම, දවුල, හොරණෑව සහ චල් වළල්ල

(3) ගැටබෙරය, දවුල, තම්මැට්ටම, හොරණෑව සහ තාලම්පොට

(4) ඩොල්කිය, චෙන්ඩාව, තබ්ලාව, කොම්බුව සහ තාලම්පොට

12. අංක 2 සහ 4 ට අයත් වාදන භාණ්ඩ අයත් වනුයේ,

(1) ආතත සහ විතතාතත ඝනයට ය. (2) විතත සහ සුසිර ඝනයට ය.

(3) විතතාතත සහ ඝන ඝනයට ය. (4) විතතාතත සහ සුසිර ඝනයට ය.

13. හේවිසි වාදනය සඳහා යොදා ගන්නේ,

(1) අංක 2, 3, 5 භාණ්ඩයන් ය. (2) අංක 1, 2, 4 භාණ්ඩයන් ය.

(3) අංක 2, 3, 4 භාණ්ඩයන් ය. (4) අංක 1, 2, 5 භාණ්ඩයන් ය.

14. සමානකම් ඇති සිංහල සහ ද්‍රවිඩ ගැමි නැටුම් ඇතුළත් නිවැරදි වරණය වනුයේ,

(1) චාමර, කඩු, කුම්මි, කරගම් ය.

(2) ලී, කළ, කෝලාට්ටම්, චෙම්බු ය.

(3) කළ, කුළු, චෙම්බු, පන්දු ය.

(4) ගොයම්, මෝල්ගස්, පින්නල් කෝලාට්ටම්, කරගම් ය.

15. පහතරට නර්තන කලාවේ වෙස් මුහුණු භාවිත කරනුයේ,

(1) චරිතයේ ස්වභාවය තීව්‍ර කර දක්වීමට ය.

(2) හාස්‍ය රසය දනවීමට ය.

(3) නළුවන්ගේ සබකෝලය නැති කිරීමට ය.

(4) රංග වස්ත්‍රාභරණවලට අලංකාරයක් ගෙනදීමට ය.

16. දක්ෂිණ භාරතයේ ප්‍රචලිත භරත නාට්‍යම් සම්ප්‍රදායේ හිසට පළඳින ආභරණ වනුයේ,

(1) ජිමික්කි, ඔට්ටියානම් සහ මාට්ටල් ය. (2) කෙවංගි, අට්ටියල් හා වලෙයල් ය.

(3) මෝදිරම්, සේලය සහ ඔට්ටියානම් ය. (4) රාක්කුඩි, උච්චිපට්ටම් සහ නෙත්තිපට්ටම් ය.

17. කතක් නර්තන සම්ප්‍රදායේ හින්දුස්ථානි සංගීතයට අනුව ඉදිරිපත් කරන නර්තන අංග දෙකකි.

(1) පද සහ කලාසම් (2) පරන් සහ ලාහෝර්

(3) පදම් සහ ආමද් (4) ආමද් සහ පරන්

18. ලක්නව් භාත්ඛණ්ඩ විශ්ව විද්‍යාලයේ උගන්වනු ලබන උත්තර භාරතීය නර්තන සම්ප්‍රදාය වනුයේ,
(1) කෘෂිකාර්මික පරිසරයෙන් පෝෂණය වූ කථක් නර්තන සම්ප්‍රදායයි.
(2) රාජ සභා ආශ්‍රිතව පෝෂණය වූ මණිපූරි නර්තන සම්ප්‍රදායයි.
(3) රාජ සභා ආශ්‍රිතව පෝෂණය වූ කථක් නර්තන සම්ප්‍රදායයි.
(4) කෘෂිකාර්මික පරිසරයෙන් පෝෂණය වූ මණිපූරි නර්තන සම්ප්‍රදායයි.

19. කතකලි නර්තනය අනෙක් නර්තන ශෛලීන්ට වඩා විශේෂ වනුයේ,
(1) රංග වින්‍යාසයෙනි. (2) ආහාර්ය අභිනයෙනි.
(3) ගායන විධිවලිනි. (4) වාදන ක්‍රමවලිනි.

20. සාම්ප්‍රදායික කතකලි නර්තනය සඳහා,
(1) කර්ණාටක සංගීතයට අනුව චෙන්ඩාව වාදනය කරයි.
(2) හින්දුස්ථානි සංගීතයට අනුව චෙන්ඩාව වාදනය කරයි.
(3) කර්ණාටක සංගීතයට අනුව වීණාව වාදනය කරයි.
(4) කර්ණාටක සංගීතයට අනුව මෘදංගය වාදනය කරයි.

21. අනුපිළිවෙළින් ගැටබෙරය, පහතරට බෙරය සහ දවුල සඳහා සුවිශේෂී වූ කොටස් හඳුන්වන නම් ඇතුළත් වරණය කුමක් ද?
(1) බෙරපුහුල, කන්වරය, හයිතට්ටුව (2) කැපුම්හම, ඉල්ලම, ගැටිය
(3) සුරත්තට්ටුව, වෙනිවර, කඩිප්පුව (4) බෙරපුහුල, හයිතට්ටුව, කඩිප්පුව

22. සොකරි, කෝලම් යන ජන නාටකවල අන්තර්ගත චරිත වෙන් වෙන්ව මෙසේ ය.
(1) පරයා, සොත්තානා - ජසයා, ලෙන්චිනා (2) වෙදරාළ, පරයා - ගුරුහාමි, සොකරි
(3) පතික්කිල, නොංචි - චුක්කිතියා, ඩුංගුරුවා (4) බහුබූතයා, අණබෙර - කාලිඅම්මා, හෙන්චයියා

23. උඩරට, පහතරට, සබරගමු ශාන්ති කර්මවලට අයත් නාට්‍යමය අවස්ථා පිළිවෙළින්,
(1) මඩුපුරය, දොළහ පෙළපාලිය, මරා ඉපැද්දීම
(2) මුවමල විදීම, තොරන් යාගය, අඹ විදමන
(3) ගුරුගේ මාලාව, දොළහ පෙළපාලිය, දෙවොල්ගොඩ බැසීම
(4) ගබඩා කොල්ලය, තොරන් යාගය, දෙවොල්ගොඩ බැසීම

24. දේශීය ශාන්තිකර්මවල භාව ප්‍රකාශනය සඳහා බහුලව ම යොදා ගෙන ඇත්තේ,
(1) රංග වස්ත්‍ර සහ වෙස් මුහුණු ය. (2) රංග වස්ත්‍ර සහ වාදනය ය.
(3) සංවාද සහ ගායනය ය. (4) සංවාද සහ ආහාර්ය අභිනය ය.

25. සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය ස්වාධීන විශ්ව විද්‍යාලයක් බවට පත් වූයේ,
(1) 1995 දී ය. (2) 2003 දී ය.
(3) 2005 දී ය. (4) 1972 දී ය.

26. මාත්‍රා 3 + 4 දෙතිතට අයත් බෙර පදය වනුයේ,
(1) දොං දොං ගජිං ජිගත (2) දොං ජිං ජිං තකට දොංතක
(3) දොං දොං ජිං ජිං ගජිගත (4) දොං දොංජිං ජිං ගජිගත

27. සුවිසි විවරණ, සත් සතිය වැනි නැටුම් අවස්ථාවල දී භාවිත කරන්නේ,
(1) ගැටබෙරය සහ උඩැක්කිය ය. (2) රබාන සහ උඩැක්කිය ය.
(3) දෙවොල් බෙරය සහ ගැටබෙරය ය. (4) ගැටබෙරය සහ පන්තේරුව ය.

28. උඩරට සම්ප්‍රදායට අයත් තුන්වන බෙර සරඹය නම්,
(1) තකට කුඳට ය. (2) තකට තකට කුඳ ය.
(3) දොම්කිත කිතදොම් ය. (4) තත් කුඳ කුඳ ය.

29. වන්නම් නර්තනයේ ආවේනික ස්වභාවය වනුයේ,

(1) ගායනයට අනුව තාලානුකූල චලනවල යෙදීම ය.

(2) බෙරපදය කියමින් නර්තනය ආරම්භ කිරීම ය.

(3) වන්නමේ විස්තරය චලනවලින් ප්‍රකාශ වීම ය.

(4) ගායනයට අනුව රිද්මයානුකූල චලනවල යෙදීම ය.

30. කොහොඹා කංකාරියේ දී පුද ලබනුයේ,

(1) බණ්ඩාර දෙවි සත් කට්ටුව සහ මෙලෙයි යකුන් ය.

(2) වැදියකුන් සහ කඩවර දෙවියන් ය.

(3) දොලහ දෙවියන් සහ සුනියම් යකුන් ය.

(4) කතරගම දෙවියන් සහ වැදියකුන් ය.

## II කොටස (උඩරට නර්තනය)




31. උඩරට ඇඳුම් කට්ටලයේ 2, 5 අංකවලින් දැක්වෙන්නේ,

(1) සිඛාබන්ධනය සහ ජටාව ය.

(2) ජටාව සහ කෙමෙත්ත ය.

(3) නෙත්තිමාලය සහ ඉනහැඩය ය.

(4) නෙත්තිමාලය සහ අවුල් හැරය ය.

32. උරබාහු සහ ඉන හැඩය දැක්වෙන්නේ,

(1) 3 සහ 4 අංකවලිනි.

(2) 2 සහ 5 අංකවලිනි.

(3) 4 සහ 6 අංකවලිනි.

(4) 3 සහ 6 අංකවලිනි.

33. උඩරට ඇඳුම් කට්ටලය සඳහා බහුල වශයෙන් ...............................වර්ණ භාවිත කරයි.

(1) සුදු සහ කළු (2) රතු සහ කළු

(3) සුදු සහ රතු (4) රතු සහ නිල්

34. "නොනැවත යනු ඇත එතැනින් ................." මෙහි ඉතිරි පද කොටස වනුයේ,

(1) දුවත් යනෙන විටත් දුවන ........... (2) හිරුත් අවර ගිරත් පැමිණි .................

(3) පිටත් පොට ගසා පනිමින ................ (4) වන පැත්ත බිය පත්ව ................

35. 11 වන ගොඩසරඹය මෙනමින් හැඳින්වේ.

(1) අර්ධ චක්‍ර සරඹය (2) චන්ද්‍රිකා සරඹය

(3) බඹර සරඹය (4) පැනීම් සරඹය

36. "තත් තොංග............. තක්කඩ............. තකතොංග තකට ............. ජික්කඩ තරිකිට තකතොංග......."

මෙහි හිස්තැන්වලට සුදුසු පද කොටස් වනුයේ,

(1) තරිකිට, තත්තොංග, තක්කඩ (2) දොමිකිත, ජික්කඩ කුං, ජිකට තොංග

(3) තත්තොංග, තරිකිට, ජිකටතොංග (4) තකතොංග, ජික්කඩකුඳ, කුජික්කඩ

37. කුදංත ගතදොං වට්ටම නටනු ලබනුයේ,

(1) මාත්‍රා $2 + 3$ දෙතිතට ය. (2) මාත්‍රා 3 තනි තිතට ය.

(3) මාත්‍රා $2 + 2 + 4$ තුන්තිතට ය. (4) මාත්‍රා 4 තනි තිතට ය.

25.07.2016
Grade 12
නර්තනය

38. "තාකු තක්කුංතරිකිට තකුද තත්ජිං ........................"මෙය,
(1) සැවුලා වන්නමට අයත් අඩව්ව වේ.
(2) මුසලඩි වන්නමට අයත් අඩව්ව වේ.
(3) කුඳුංත ගතදොං වට්ටමට අයත් පිරීමේ පදය වේ.
(4) මුසලඩි වන්නමට අයත් සීරුමාරුව වේ.

39. උඩරට වන්නමක ව්‍යුහය මෙසේ ය.
(1) බෙරපදය, තානම, කවිය, කස්තිරම, සීරුමාරුව, අඩව්ව
(2) තානම, කවිය, පදය, කස්තිරම, අඩව්ව, සීරුමාරුව
(3) තානම, මාත්‍රා නැටීම, කස්තිරම, සීරුමාරුව, අඩව්ව
(4) තිත, බෙරපදය, පද නැටීම, කස්තිරම, සීරුමාරුව, අඩව්ව

40. ගැටබෙරයෙන් පමණක් වාදනයට සුදුසු බෙරපදයක් වන්නේ කුමක් ද?
(1) ජිංකිට තත් තත් කිටිතක (2) ගුං දෙගත ගත්තගුං
(3) දොං දොං ජිං ජිං ගජිගත (4) ගුහිදි ගදිරි ගත

විභාග අංකයඃ ..........................................................

| 11 ශ්‍රේණිය | II කොටස |
|---|---|

**උපදෙස්**

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.

i. "ශාන්ත" නැමති ස්ථායි භාවයෙන් උපදින රසය............ නම් වේ.

ii. මාත්‍රා 3 + 4 සහ මාත්‍රා 3 යන තාල රූප දෙකම ඇතුළත් කර නිර්මාණය වූ වන්නම කුමක් ද?

iii. මහනුවර යුගයේ ................. රාජ ස්තෝත්‍ර, වන්නම් සහ විරිඳු ගායනා පැවැත් වූ ස්ථානය ලෙස සැලකේ.

iv. කෝලම් නාටකය රඟ දක්වන එළිමහන් රංග භූමිය හඳුන්වන්නේ .................. යනුවෙනි.

v. මූර්ති ශිල්පය සහ චිත්‍ර කලාව පමණක් නොව ගායනය ද ප්‍රබල ලෙස යොදා ගනිමින් නර්තනය ඉදිරිපත් කරන්නේ ............. ශාන්ති කර්මයේ දී ය.

vi. .................. වන්නි ප්‍රදේශයේ ප්‍රචලිත ගැමි නාටකයකි.

vii. දේශීය නර්තන සම්ප්‍රදායන් හා බැඳි පුරාවෘත්ත කතා බොහෝවිට ගොඩනැගී ඇත්තේ දෙවියන් සහ ....................... පිළිබඳව ය.

viii. ............................... නර්තන කලාවේ නව ප්‍රවණතාවයකි.

ix. කතකලි නර්තන සම්ප්‍රදායේ වේශ නිරූපන ක්‍රම දෙකක් නම් කරන්න.

x. විසිවන සියවසේ ශ්‍රී ලංකාවේ නර්තන ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට දායක වූ කාන්තාවන් දෙදෙනා නම් කරන්න.

(මුළු ලකුණු 12)

02. i. මාත්‍රා 3 තනි තිතට අයත් ජන ගීයක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

ii. මාත්‍රා 3 + 4 දෙතිතට අයත් වන්නමක කවියක් සහ කස්තිරම ප්‍රස්තාරගත කරන්න. (ලකුණු 04)

iii. මාත්‍රා 2 + 2 + 4 තුන් තිතට අයත් අඩව්වක් ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 04)

03. පහත සඳහන් මාතෘකා තුනක් පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.

- පණිභාරත මහතා
- මෝල්ගස් නැටුම
- නව නාට්‍ය රස
- කප් සිටුවීම
- වන්නම්

(ලකුණු 4X3 = 12)

25.07.2016

Grade 12

නර්තනය.

Learning Resource Center De Mazenod College Kandana

04. i. කෝලම් නාටකය ප්‍රචලිත ප්‍රදේශ හතරක් (04 ක්) ලියන්න. (ලකුණු 02)

ii. කෝලම් නාටකය පැවැත්වීමේ අතීත සහ වර්තමාන හේතු දෙක බැගින් ඉදිරිපත් කරන්න. (ලකුණු 04)

iii. ලෙන්චිනාගේ චරිතය විදහා දක්වෙන කවියක් ලියා එය පැහැදිලි කරන්න. (ලකුණු 06)

05. i. ශ්‍රී ලංකාවේ ප්‍රචලිත සිංහල නර්තන සම්ප්‍රදායන් තුන නම් කර ඒවාට අයත් ශාන්ති කර්ම තුනක් පිළිවෙළින් ලියන්න. (ලකුණු 04)

ii. ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් ශාන්ති කර්මය ප්‍රචලිත ප්‍රදේශ දෙකක් සහ පැවැත්වීමේ හේතු දෙකක් ලියන්න. (ලකුණු 04)

iii. එහි පූර්ව චාරිත්‍ර දෙකක් ලියා රංගමණ්ඩල අලංකාර කර ගැනීමට අමුද්‍රව්‍ය යොදාගෙන තිබූ අයුරු විස්තර කරන්න. (ලකුණු 04)

06. i. ඔබ උගත් ග්‍රහ පන්ති කවියක් සහ මෝල්ගස් කවියක් ලියා දක්වන්න. (ලකුණු 04)

ii. ප්‍රශස්ති ගායනයන් හි සංස්කෘතික පසුබිම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

iii. ගැමි නැටුමක් නිර්මාණය කිරීමේ දී ඔබ අවකාශය යොදා ගන්නා ආකාරය උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 04)

07. ශ්‍රී ලංකාවේ නර්තන කලාවේ නූතන ප්‍රවණතා පිළිබඳ උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 12)